# Abstract 26

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම පිළිබඳ බෞද්ධ විග්‍රහය

**ඊ. යූ. පී. චන්දිමා පතිරණ,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රථම වසර - බෞද්ධ සංස්කෘතිය),
*pathiranachaandi@gmail.com*

මෙම පර්යේෂණය මූලික වශයෙන් ම අයත් වන්නේ බෞද්ධ සමාජ දර්ශනයේ එන බෞද්ධ අධ්‍යාපන විෂය ක්ෂේත්‍රයට ය. මුල් බුදුසමයේ එන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම කවරේ ද යන්න පිළිබඳව ප්‍රමාණවත් හඳුනා ගැනීම් සිදු නොවී තිබීම මෙම පර්යේෂණයේ ගැටලුව යි. මෙම පර්යේෂණය මූලාශ්‍රයාගත කරුණු ආශ්‍රයෙන් කෙරෙන අධ්‍යයනයකි. බුදුරජාණන් වහන්සේ දේශනා ක්‍රම, භාෂා භාවිතය, ප්‍රස්තුත විවරණය, උපමා රූපක භාවිතය, අතුරු කථා, සාකච්ඡා ක්‍රමය හා ප්‍රශ්නෝත්තර ක්‍රමය ආදිය භාවිත කරමින් ස්වකීය ශ්‍රාවකයනට ධර්මාවබෝධය ලබා දීමට උත්සුක වූ අතර, එය ඥානය ලබා දීමේ සාර්ථක ක්‍රමවේදයක් විය. බුදුදහමේ අධ්‍යාපන පරමාර්ථය වනුයේ සමස්ත මානව ප්‍රජාව තුළ සමානුරූපී බුද්ධිමය හා ගුණාත්මක පදනමක් සැකසීම යි. එකී කාර්යය කවර විෂයයක් පදනම් කරගෙන වුව ද කිරීමේ හැකියාවක් පවතී. අවශ්‍ය වන්නේ ක්‍රමවේද හඳුනා ගැනීම පමණකි. එකී ක්‍රමවේද හඳුනා ගැනීම පර්යේෂණාත්මක කාර්යයක් වන අතර අධ්‍යාපනයට ආර්ථික වටිනාකම් දීම එයට ප්‍රමුඛ බාධකයක් වේ. මහාවිහාරික බෞද්ධ අධ්‍යාපනයේ පිළිගැනීම වන්නේ ආර්ථික ප්‍රතිලාභ හේතුවෙන් අධ්‍යාපනය ලැබීමට වඩා නිදි වැදීම උසස් ය යන්න යි. එබැවින් උසස් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපනය ලබා දීමේ උපාය මාර්ග හඳුනා ගැනීමට ඇති හැකියාව පිළිබඳ විමර්ශනයක් කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

**ප්‍රමුඛ පද :** අධ්‍යාපන පරමාර්ථ, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම, බෞද්ධ අධ්‍යාපනය